# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 713 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 26/04/2024 පැය 0905

## මාධ්‍ය නිවේදනය

**යුධ හමුදා කැබ් රථයක් අනතුරකට ලක් වී යුධ හමුදා සෙබළෙකු මිය යාම - මාන්කුලම පොලිස් වසම.**

2024.04.26 වන අද දින අළුයම් කාලයේ මාන්කුලම පොලිස් වසමේ වසන්තනගර් හංදිය අසලදී, මාන්කුලම් දෙස සිට කිළිනොච්චිය දෙසට ධාවනය වූ ලොරි රථයක් ඊට ඉදිරියෙන් ගමන් ගත් යුධ හමුදා සෙබළුන් රැගත් කැබ් රථයක ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් කැබ් රථයේ පිටුපස ගමන් කළ යුධ හමුදා සෙබළෙකු රථයෙන් විසි වී ගොස් පිටුපසින් පැමිණි ලොරි රථයේ ගැටී බරපතල තුවාල ලබා කිළිනොච්චිය රෝහලට ඇතුලත් කරන විටත් මියගොස් ඇත. තුවාල ලැබූ තවත් සෙබළුන් 09 දෙනෙකු ප්‍රතිකාර සඳහා කිළිනොච්චිය රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ ඇහැටුවැව, ගල්ගමුව ප්‍රදේශයේ පදිංචි යුධ හමුදා 07 වන සේවා බලකායට අනුයුක්ත මුරුක්කණ්ඩි කඳවුරේ සැරයන්වරයෙකු වේ.**

මෘත ශරීරය කිළිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මාන්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**